# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 16 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2022 සැප්තැම්බර් මස 16 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 15.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 16 වන දින]

එල්.ඩී.—ඕ. 24/2021

**1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 1971 අංක 45 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (3) වන උපවගන්තියේ "රුපියල් දහසකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට "රුපියල් විසි දහසකට නොවැඩි දඩයකට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:—

"(3අ) (1) යම් සේවායෝජකයකු (3) වන උපවගන්තිය යටතේ වන වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබා දෙන තීරණයකට අනුකූලව කටයුතු කිරීම ඔහු විසින් අඛණ්ඩව පැහැර හරිනු ලබන්නේ නම්, වරදකරු කරනු ලැබීමෙන් පසු, (3) වන උපවගන්තිය යටතේ පනවනු ලබන යම් දඩයකට අතිරේකව, එම තීරණයට අනුකූලව කටයුතු නොකිරීම අඛණ්ඩව කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක අතිරේක දඩයක් කම්කරුවාට ගෙවීමට එම සේවායෝජකයා යටත් විය යුතු ය.

(2) යම් සේවායෝජකයකු විසින්, (2) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ කම්කරුවකුට ගෙවිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක, එම සේවායෝජකයා වරදකරු කරනු ලැබ ඇත්තේ කවර මහෙස්ත්‍රාත් අධිකරණයකින් ද, එම මහෙස්ත්‍රාත් අධිකරණයෙන් ඔහුට පනවන ලද දඩයක් ලෙස ඒ අධිකරණය විසින් කරනු ලබන ආඥාවක් මඟින් එම මුදල අයකරගනු ලැබිය හැකි අතර, එසේ අයකරගනු ලබන මුදල කම්කරුවාට ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "රුපියල් පනහක දඩයකට" යන වචන වෙනුවට "රුපියල් පන්සියයක දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ සහ 10ආ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 10අ සහ 10ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

"මහාධිකරණය වෙත කරන ඉල්ලීමක් සම්බන්ධයෙන් සේවායෝජකයා විසින් ඇප මුදලක් ඉදිරිපත් කළ යුතු බව

10අ. (1) යම් සේවායෝජකයකු මහෙස්ත්‍රාත් අධිකරණය විසින් කරනු ලබන ආඥාවකින් අතෘප්තියට පත් වූ අවස්ථාවක, එම සේවායෝජකයා විසින්, එම මහෙස්ත්‍රාත් අධිකරණය පිහිටා ඇත්තේ යම් පළාතක් තුළ ද, එම පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය වෙත ඒ ආඥාවට එරෙහිව ලිඛිත පෙත්සමක් මඟින් ප්‍රතිශෝධන ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරන සෑම සේවායෝජකයකු විසින් ම, එම ඉල්ලීමට විෂයය වන ආඥාවෙන් කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස විධාන කරනු ලබන අවස්ථාවක, එම මුදලට සමාන ඇප මුදලක් එම මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, එම සේවායෝජකයා විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල යථා පරිදි ඉදිරිපත්කොට ඇති බවට අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

(4) මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ ඇප මුදල් ලෙස ඉදිරිපත් කරනු ලබන සියලු මුදල්, ශ්‍රී ලංකාව තුළ අනුමත බැංකුවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන, පොළී දරන යම් ගිණුමක තැන්පත් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාට යැවීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

අභියාචනාධිකරණය වෙත කරන ඉල්ලීමක් සඳහා සේවායෝජකයා විසින් ඇප මුදලක් ඉදිරිපත් කළ යුතු බව

10ආ. (1) යම් සේවායෝජකයකු 6 වන හෝ 6අ වන වගන්ති යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරන ලද නියමයකින් අතෘප්තියට පත් වූ අවස්ථාවක, එම සේවායෝජකයා විසින් රිට් ආඥාවක ස්වභාවයෙන් වූ ආඥාවක් නිකුත් කිරීම සඳහා එම නියමයට එරෙහිව අභියාචනාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

(2) රිට් ආඥාවක ස්වභාවයෙන් වූ ආඥාවක් නිකුත් කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරන සෑම සේවායෝජකයකු විසින් ම, එම ඉල්ලීමට විෂයය වන නියමය මඟින්-

(අ) වන්දි ලෙස යම් මුදලක් ගෙවන ලෙස ද, නැවත සේවයේ පිහිටුවන ලෙස ද, විධාන කරනු ලබන අවස්ථාවක, එම නියමයේ දින සිට එම කම්කරුවා නැවත සේවයේ පිහිටුවනු ලැබිය යුතු දින දක්වා ගණනය කළ යුතු වැටුප් හෝ වේතන ලෙස වන යම් මුදල් ප්‍රමාණයක් සහ නැවත සේවයේ පිහිටුවීම වෙනුවෙන් එම කම්කරුවාගේ මාසික වැටුප හෝ වේතන මෙන් දොළොස් ගුණයක් වූ මුදලක ඇප මුදලක්; සහ

(ආ) වන්දි ලෙස කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස පමණක් විධාන කරනු ලැබූ අවස්ථාවක, එම මුදලට සමාන මුදලක ඇප මුදලක්.

අභියාචනාධිකරණය වෙත තබනු ලැබිය යුතු ය.

(3) රිට් ආඥාවක ස්වභාවයෙන් වූ ආඥාවක් නිකුත් කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක්ම, එම සේවායෝජකයා විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල යථා පරිදි ඉදිරිපත්කොට ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් ස්වකීය අත්සන යටතේ නිකුත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණය, ශ්‍රී ලංකාව තුළ අනුමත යම් බැංකුවක කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොළී දරන ගිණුමක තැන්පත් කිරීම සඳහා කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(5) කොමසාරිස් ජනරාල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, අභියාචනාධිකරණය හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් වන අවසාන තීරණය ප්‍රකාර, (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඇප මුදල එම මුදලට අදාළ පොළිය ද සමඟ අදාළ පාර්ශ්වයට ආපසු ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ "රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් විසිදහසක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**6.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.